Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් පුරවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ I පන්තියේ තනතුරු (SL-01-2006A) සඳහා රාජ්‍ය අංශයේ නිලධාරීන් අනුයුක්ත කිරීම

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ ( SL-01-2006 A) I පන්තියේ අධ්‍යක්ෂ තනතුරු සඳහා අනුයුක්ත වීමට මනාපය පළ කරන, මේ වන විට රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාළ පුරප්පාඩු තනතුරු පහත දැක්වෙන අතර එක් එක් තනතුරට නියමිත අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පහත දක්වා ඇති ආකෘතිය අනුව සකස් කළ අයදුම්පත්‍රයක් 2021.12.15 දින හෝ ඊට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අ.අ.* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| i. | අධ්‍යක්ෂ (ගවේෂණ හා ලේඛනගත කිරීම්) | 01 |
| ii. | අධ්‍යක්ෂ (කැණීම්) | 01 |
| iii. | අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා) | 01 |
| iv. | අධ්‍යක්ෂ (කෞතුකාගාර) | 01 |
| v. | අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) | 01 |
| vi. | අධ්‍යක්ෂ (නඩත්තු) | 01 |
| vii. | අධ්‍යක්ෂ (ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ) | 01 |

01. *අනුයුක්ත කරගැනීමේ ක්‍රමය :*

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්කරුවන් ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාව මත පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එමගින් තෝරාගත් අයදුම්කරුවන් තනතුරු පුරප්පාඩු සඳහා අනුයුක්ත කරනු ලැබේ.

02. *සුදුසුකම් :*

i. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :

- අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

| *අ.අ.* | *තනතුර* | *අධ්‍යාපන සුදුසුකම් (පශ්චාත් උපාධි)* |
|---|---|---|
| i. | අධ්‍යක්ෂ (ගවේෂණ හා ලේඛනගත කිරීම්) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පුරාවිද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් |
| ii. | අධ්‍යක්ෂ (කැණීම්) | |
| iii. | අධ්‍යක්ෂ (අභිලේඛන හා නාණක විද්‍යා) | |
| iv. | අධ්‍යක්ෂ (කෞතුකාගාර) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පුරාවිද්‍යාව/කෞතුකාගාර විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් |
| v. | අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ජනසන්නිවේදනය තොරතුරු කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් |
| vi. | අධ්‍යක්ෂ (ව්‍යාපෘති මෙහෙයුම් හා අධීක්ෂණ) | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සැලසුම්කරණය, ව්‍යාපාර කළමනාකරණය හා ආර්ථික සංවර්ධනය යන ක්ෂේත්‍රවලට අදාළ ශාස්ත්‍රපති මට්ටමේ පශ්චාත් උපාධියක් |
| vii. | අධ්‍යක්ෂ (නඩත්තු) | ශ්‍රී ලංකා වරලත් ඉංජිනේරු ආයතනයේ වරලත් ඉංජිනේරු පූර්ණ සහතිකය හෝ ශ්‍රී ලංකා වරලත් වාස්තු විද්‍යා ආයතනයේ වරලත් වාස්තු විද්‍යාඥ පූර්ණ සහතිකය |

ii. *පළපුරුද්ද :*

උක්ත සඳහන් අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරන ලද රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම;

*හෝ*

උක්ත අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කරන ලද විධායක ශ්‍රේණියේ තනතුරක වසර 17ක සේවා කාලයක් සහිත නිලධාරියෙකු වීම.

03. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

i. අයදුම්පත් 2021.12.15 දිනට හෝ එදිනට ප්‍රථම පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතු වේ. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. ඉදිරිපත් කළ යුතු අයදුම් පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A 4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 1.0 සිට 3.0 දක්වාත් 02 වන පිටුව අංක 4.0 සිට 6.0 දක්වාත් 03 වන පිටුව 7.0 සිට 8.0 දක්වාත් වන ආකාරයෙන් පිළියෙල කළ යුතු ය. ඔබගේ පහසුව සඳහා නිවැරදිව සකස් කරන ලද විභාග අයදුම් පත්‍රය පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවියෙන් (www.archaeology.gov.lk) බාගත කළ හැකි වේ. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.)

iii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ ''පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

iv. සියලුම අපේක්ෂකයින් තම අයදුම්පත් තමන් සේවය කරන ආයතනයෙහි ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

v. සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපෑලේදී අයදුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාද වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

04. මෙම රෙගුලාසිවල නොමැති කරුණු පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

05. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතා-වයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය අනුර මනතුංග,
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්.

2021 නොවැම්බර් මස 02 වැනි දින,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

**ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයට අයත් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තනතුරු සඳහා බඳවා ගැනීම - 2021**

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණයි)

| |
|---|
| 01. |
| 02. |
| 03. |
| 04. |

(අයදුම්කරන තනතුර/තනතුරු)

1.0 1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 මුලකුරු සමඟ නම (මයා/මිය/මෙය) (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (උදා : GUNAWARDHANA, M. G. B. S. K.) :————.

2.0 2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ කොටුව තුළ ලියන්න) පුරුෂ - 0 ස්ත්‍රී -1 ☐

3.2 විවාහක/අවිවාහක බව : (අදාළ කොටුව තුළ ලියන්න) විවාහක - 1 අවිවාහක - 2 ☐

3.3 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.4 2021.12.15 දිනට වයස : අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.5 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

3.6 දුරකථන අංකය ජංගම ☐☐☐☐☐☐☐☐☐☐

ස්ථාවර ☐☐☐☐☐☐☐☐☐☐

4.0 4.1 වර්තමාන තනතුර :————.

4.1.1 එම තනතුරට පත්වූ දිනය :————.

4.2 සේවය :————.

4.3 ශ්‍රේණිය :————.

4.3.1 එම ශ්‍රේණියට පත්වූ දිනය :————.

4.4 කාර්යාලයීය ලිපිනය :————.

4.5 විධායක සේවා ගණයේ මුළු සේවා කාලය :————.

4.5.1 ඊට අදාළ විස්තරය :————.

| අ.අ. | තනතුර | කාලය (...... සිට...... දක්වා) |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5.0 5.1 අධ්‍යාපන සුදුසුකම් : ............................................................
............................................................
............................................................

5.2 වෘත්තීය සුදුසුකම් : ............................................................
............................................................
............................................................

5.3 භාෂා ප්‍රවීණතාව : ............................................................
............................................................
............................................................

5.4 තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම : ............................................................
............................................................
............................................................
............................................................

6.0 ඔබට එරෙහිව කිසියම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන තිබේ ද?
(අදාළ කොටුවේ ලකුණ ( ✓ ) යොදන්න)

| ඔව් | |
|---|---|

| නැත | |
|---|---|

(පිළිතුර ''ඔව්'' නම් විස්තර කරන්න)

............................................................
............................................................
............................................................

7.0 අයදුම්කරුගේ සහතිකය :

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව ද, සියලු කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ

පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බව ද, සියලු නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 *දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :*

ඉහත විස්තර සඳහන් .................................... මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවය කරන බවද, ඔහු/ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බව ද, ඔහුගේ/ඇයගේ වැඩ හා පැමිණීම සතුටුදායක බවද, ඔහුට/ඇයට විරුද්ධව කිසිදු චෝදනාවක් නොවන බව ද, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි බවද සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව යොදන්න)